අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් රුකූඋහි සිට එතුමාණන්ගේ පිට ඔසවා ගත් විට "සමිඅල්ලාහු ලිමන් හමිදා'

ඉබ්නු අබී අව්ෆා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. අල්ලාහ්ගේ
දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් රුකූඋහි සිට එතුමාණන්ගේ පිට ඔසවා
ගත් විට "සමිඅල්ලාහු ලිමන් හමිදා' යැයි පවසා 'අල්ලාහුම්ම රබ්බනා වලකල් හම්දු මිල්අස් සමාවාති වමිල්අල් අර්ළි වමිල්අ මා ෂිඃත මින් ෂෙයිඉන් බඃද්" යැයි පවසයි.
[صحيح] [رواه مسلم]

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් සලාතයේ රුකූඋහි සිට එතුමාණන්ගේ කොන්ද ඔසවා ගත් විට "සමිඅල්ලාහු ලිමන් හමිදා'* යැයි පවසයි එනම්: කවරෙකු උත්තරීතර අල්ලාහ්ට ප්රශංසා කළේ ද ඔහු වෙනුවෙන් අල්ලාහ් ප්රතිචාර දක්වනු ඇත. ඔහුගේ ප්රශංසා කිරීම පිළිගෙන ඔහුට කුසල් පිරිනමනු ඇත. පසුව මෙසේ තවදුරටත් අල්ලාහ්ව ප්රශංසා කරයි: 'අල්ලාහුම්ම රබ්බනා වලකල් හම්දු මිල්අස් සමාවාති වමිල්අල් අර්ළි වමිල්අ මා ෂිඃත මින් ෂෙයිඉන් බඃද්" එනම්: අහස්, මහපොළොව හා ඒ දෙක අතර ඇති දෑ පුරාවටම, අල්ලාහ් අභිමත කරන දෑ පුරාවරටම ඇති ප්රශංසාවන්ය.

http://www.sunnah.global/hadeeth/si/show/65101